# මක්ෂිම් ගෝර්කි ගේ මහා නවකතාව




සිංහලට නගන්නේ
**දොස්තර කීර්ති කුලසේකර**
(MBBS Mphil PhD)
ල ට්‍රෝබ් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය සහ බෙන්ඩිගෝ මූලික රෝහලේ වෛද්‍ය නිලධාරී.

**සුමිත් පෙරේරා ගේ සිතුවමින්**

දෙවන පරිච්ඡේදය - දෙවන කොටස

## වල්සොලොව් නිවසේ ජීවිතය

### අම්මාගේ අවවාදය

කොහේදෝ ඈතක සිට එන මවගේ මෘදු හඬ නැවතත් ඔහු සවනත වැකුණේ ය.

"උඹ කොහොමද මගේ පුතේ මට කන්න අඳින්න ගෙනත් දීලා මාව බලා ගන්නේ මෙහෙම බොන්න පටන් ගත්තම?"

පාවෙල් තම දෑස් තදින් පියා ගත්තේ මවට පිළිතුරක් ද සපයමිනි.

"මම විතරක් යැ.. හැම එකාම බොනවා.."

අම්මා දිගු සුසුමක් හෙළුවාය. පුතා කියන්නේ ඇත්තය. තැබෑරුම හැරෙන්නට ගමේ උන්ට සතුටු සාමිචියේ යෙදීමට හැකි වෙනත් නැති බව ඇය හොඳින් දැන සිටියාය.

මත්පැන් වල රසය හැරෙන්නට වෙන කිසිම රසවත් දෙයක් මේ ගම වැසියන් දැන සිටියේ නැති බව ඕ හොඳින් දැන සිටියාය. කරුණු එසේ වුවද අම්මා තම ආදරණීය පුතු අමතා මෙසේ පැවසුවාය.

"ඒ වුනාට උඹ ඔය දහ ජරාව කටේ තියන්න එපා මයේ පුතේ.. උඹේ අප්පා උඹලා දෙන්නටම හරියන්න බිව්වනේ බං..ල ලැන්දෑ මට දුන්න දස වදේ මදිද? මයේ පුතත් අම්මට වදයක් වෙන්නද හදන්නේ.. නෑ නේද?"

මවගේ මෘදු එහෙත් ශෝකී හඬට සවන් දුන් පාවෙල් ගේ සිත අතීතයට ඇදුනේ ඉබේටමය.

සිය පියා ජීවත්ව සිටි කාලය පුරාම අම්මා නිවසේ කැපී පෙනෙන චරිතයක් නොවීය.

ඒ කාලේ ඇය ඉතා නිශ්ශබ්ධ භූමිකාවක් රඟ දැක්වූයේ කොයි වෙලේ ඔහුගෙන් ගුටි බැට ලබන්නට වේදෝයි යන සැකයයත් පෙරදැරි කරගෙනය.

තම පියා මග හරින්නට ප්‍රිය කළ පාවෙල් එකල නිවසේ සිටියේ ඉතා කලාතුරකිනි.

ඒ නිසාම පසුකාලීනව තම ආදරණීය මව මුණගැසුනේද ඉතා අඩුවෙනි.

දැන්... ඔහුගේ වෙරි හිඳී ගොසිණි. පාවෙල් සිය මව දෙස ඇසි පිය නොහොල්ලා බලා සිටියේය..

ඇය සැහෙන්න උස කාන්තාවකි. තරමක් ඉදිරියට නැඹුරු වූ පිට කොන්දකින් යුක්ත වුවාය. ඇයගේ තරබාරු ශරීරය ඉදිමී තඩිස්සි වී තිබුනේ වසර ගණනාවක් ගේ දොර වැඩට වෙහෙසීමෙන් සහ සිය ස්වාමියාගේ තාඩන පීඩන වලට ගොදුරු වීම හේතුවෙනි.

ඇය එහා මෙහා ඇවිද්දේ කිසිවෙකුටත් නො ඇසෙන තරම් නිශ්ශබ්දතාවක් ඇතිවය. පැත්තකට ඇලවී යන ගමන් විලාශය පෙන්නුම් කළේ හරියට යමෙක හැපීමෙන් වැළකීමට මෙන් කල ගමන් ඉරියව්වකි.

ඇයගේ පුළුල් ඕවලාකාර මුහුණු තරමක් තඩිස්සි වී තිබුණ අතර එහෙමෙන් මෙහෙන් රැළි වැටී ගොසිනි. ඒ මුහුණ ප්‍රභාමත් කරමින් තිබුණු තද කළු පැහැති ඇස් දෙක අධික ලෙස තෙහෙට්ටුව්වට පත් වූ බවක් පෙන්නුම් කෙරිණි. හරියට ඒ ගමේ බොහෝ ගැහැණුන් ගේ දෑස් මෙන් ඒවා අධික වෙහෙසට පත්ව තිබුණි. ඇයගේ දකුණු ඇහි බැමට ඉහලින් ඝන තද කළු පැහැති තුවාල කැළලකි.

ඒ නිසා ඇයගේ ඇහිබැම මදක් ඉහලට ඇඹරී තිබූ අයුරු හොඳින් විද්‍යමාන විය.

ඇයගේ දකුණු කණත් වම් කණට වඩා තරමක් ඉහලින් පිහිටා තිබුණේය. ඒ පිහිටීම ඇයට භීතියෙන් හා සන්ත්‍රාසයෙන් ඇහුම්කන් දෙන්නට පුරුදු වූ ගැහැණියකගේ පෙනුමක් එක් කළේය.

ඇයගේ ඝන කළු හිසෙහි අතරින් පතර අළු පැහැති පැල්ලම් මතුවී තිබුනේ හරියට සැමියාගෙන් ලැබූ පහරකෑම් වලින් ලැබුණු සලකුණු මෙනි.

ඇය මෘදු වූත් වැඩි කැළඹීමක් නැති වූත් ගති ඇත්තියක මෙන් පෙනුනද .. හෙමින් හෙමින් ඇගේ කම්මුල් දිගේ කඳුළු බිංදු රූරා වැටෙන්නට පටන් ගත්තේය..



"අම්මා... අඬන්න එපා..." පුතා බයාදුවූත් මෘදු වූත් හඬකින් ඇයට ආයාචනා කළේය.

"මට බොන්න මොනවා හරි දෙන්න"

සැණෙකින් නැගී සිටි ඈ... "මම ශීතල වතුර ටිකක් ගේන්නම්" යැයි කියමින් එතැනින් පිට වුවාය. කුස්සිය දෙසට ගිය ඈ වතුර විදුරුවකුත් ගෙන තම පුතුගේ ඇඳ දෙසට ඇදුණාය.

එහෙත් ඒ සුළු මොහොත ඇතුලත පුතු තද නින්දකට වැටී සිටි බව පෙනෙන්නට තිබිණි.

ඇඳ පාමුලට පැමිණි අම්මා තම පුතු දෙස මදක් බලා සිටියේ ඉතා සෙමින් හුස්ම ඉහළ පහළ දමමිනි.

ඇගේ දෙඅත් තදින් වෙවුලන්නට පටන් ගත්තේය. විදුරු වේ තිබු වතුර ඉහිරෙන්නට ඔන්න මෙන්න මෙන් විය.

තම සුරත රැඳී වතුර වීදුරුව මේසය මත තැබූ ඈ අසල බිත්තියේ එල්ලෙන දේව පින්තූරය දෙස බැලූවාය.

දේව රූපය ඉදිරියේ දණින් වැටුණු ඈ නිහඬව දෙවියන්ට යාතිකා කලාය.

අඳුරුන් පිරුණු බේබදු ජීවන හඬ ජනෙල් පලූ වල ගැටෙන හඬත් , යමෙකු කුණුහරුපයෙන් තවකෙකුට බැන අඩගසන හඬත් විසින් නිහඬ රාත්‍රිය සසල වෙයි.

තවකෙක් වෙරි මතේ ගීතයක් ගයයි. ගැහැණුන්ගේ ගේ උත්කර්ෂණය වූ බොල් කට හඬවල් වාතලය කපාගෙන එයි.

### වල්සොලොව් නිවසේ ජීවිතය

මේ අතර කුඩා වල්සොලොව් නිවසේ ජීවිතය ඒකකාරී ලෙස ගලායයි. එහෙත් එය ඉස්සරට වඩා සාමකාමී මෙන්ම බාධක කම්කටොළු වලින්ද තොර වූවකි.

එසේම ගමේ අනෙකුත් නිවෙස් වල ජීවන රටාවට වඩා තරමක් වෙනස් මගක් ගත් එකකි.

මේ නිවස පිහිටා තිබුනේ ගමේ කෙළවරට වන්නට තිබු වගුරු බිමට ආසන්න කුඩා පහත් බිමකයි. නිවසේ තුනෙන් එකක්ම පැතිරී තිබුනේ කුස්සියත් එයටම යාබදව තිබූ අම්මාගේ නිදන කාමරයත් යන කොටස් දෙකයි.

අම්මාගේ කාමරය කුස්සියෙන් වෙන් කෙරුනේ සීලිමේ උසින් භාගයක් පමණ උසට බැඳී කොට බිත්තියක් මගිනි. නිවසේ අනෙක් තුනෙන් දෙකක කොටස පුරා තිබුනේ ජනෙල් දෙකකින් යුත් හරි හතරැස් කාමරයකි. එහි එක මුල්ලක පාවෙල් ගේ ඇඳයි. එයට ඉදිරියෙන් කුඩා මේසයක් සහ පුටු දෙකක් විය.

තව බංකු කිහිපයකුත් කුඩා වීදුරුවකින් වැසුණු කනප්පුවකුත් එහි තිබු බඩු භාණ්ඩ අතර විය.

ඊට අමතරව මුළු නිවසටම ගෘහ භාණ්ඩ ලෙස තිබුනේ බිත්ති ඔරලෝසුවක්, රෙදි දමන ට්‍රන්ක පෙට්ටියක් සහ කුඩා සුරුවම් දෙකක් පමණි.

පාවෙල් ද ගමේ අනෙකුත් තරුණයින්ට බෙහෙවින් සමාන වූ දිවියක් ගත කරන්නට උත්සාහ ගත්තේය. එමෙන්ම නාඹර වයසේ තරුණයෙක් කලයුතු දේවල් හැම එකක්ම කරන්නට ඔහු ද පසුබට නොවීය.

ඔහු ඔහුගේම යැයි කියා අකෝඩියන් එකක් ගත්තේය. ඉදිරි පස කැඳ දැමූ කමිසයක් මිලදී ගත්තේය.

තද පැහැති ටයි පටියක් , දණහිස් දක්වා උස සපත්තු ජෝඩුවක් සහ අත් දෙකින් අල්ලා නම නමා යාහැකි වේවැලක් ද ඔහුගේ මිත්තුව ට ගත් දේවල් අතර විය.

බාහිර පෙනුමෙන් හා ක්‍රියාකාරකම් වලින් පාවෙල් ගේත් සම වයසේ වූ අනිත් තරුණයන්ගේත් අතර කිසිදු වෙනස් කමක් දක්නට ලැබුනේ නැත.

ඔහු සැන්දෑ සාදා වලට සහභාගී වුවේය. "පොල්කා" සහ "කොඩ්රිල්" නර්තන ඉගෙන ගත්තේය.

සෙනසුරාදා ඉරිදා සහ අනෙකුත් නිවාඩු දිනවල පාවෙල් වැනි වැනි ගෙදර ආවේ මත් පැන් පානය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ඔහු හැම විටම මත්පැන් බීමේ ප්‍රතිවිපාක වලින් බැට කෑවේය.

පසුදා උදේ ඇඳෙන් නැගිටින වෙලාව වන විට පාවෙල් ගේ හිස යකාගේ කම්මල මෙන් විය.

එවන් උදෑසනක අධික හිසේ කැක්කුමෙන් පාවෙල් ගේ හිස පුපුරු ගහන්නට ගත්තේය.

**මතු සම්බන්ධයි**